නිපුණතාව 9 - විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇතිකරන බලපෑම ගවේෂණය කරයි.

- රටක් අවශේෂ ලෝකයේ රටවල් සමඟ භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම ජාත්‍යන්තර වෙළෙඳාම හෝ විදේශ වෙළෙඳාම ලෙස සැලකේ.එය අපනයන වෙළෙඳාම හා ආනයන වෙළෙඳාම යනුවෙන් දෙකොටසකි.දේශීය නිශ්පාදිත භාණ්ඩ හා සේවා විදේශ රටවලට අලෙවිකිරීම අපනයනය ලෙසත් විදේශීය නිශ්පාදිත භාණ්ඩ හා සේවා මිලට ගැනීම ආනයනය ලෙසත් හැඳින්වේ.ඕනෑම රටක් හෝ ආර්ථිකයක් ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වන්නේ එමගින් ලැබිය හැකි විශේෂිත ප්‍රතිලාභ අත්පත් කර ගැනීමටය.

## <u>ජාත්‍යන්තර වෙළෙඳාමට සහභාගී වීමෙන් ලැබෙන වාසි</u>

1.දේශීය නිශ්පාදකයාට ඉතා විශාල වෙළෙඳපොලක් හිමිවීම.

2.දේශීයව නිපදවිය නොහැකි නිෂ්පාදිත මිළදී ගත හැකි වීම.

3.දේශීයව නිපදවිය හැකි නමුත් ප්‍රමාණවත් නොවන නිෂ්පාදිත මිළදී ගත හැකි වීම.

4.ගුණාත්මක අතින් උසස් නිෂ්පාදිත මිළදී ගත හැකි වීම.

5.පරිමාණානුකූල පිරිමැසුම් මගින් තරඟකාරීත්වය ඉහළ නංවා ගත හැකි වීම.

6.දියුණු තාක්ෂණය අත්පත් කර ගත හැකිවීම.

7.ආර්ථික වෘද්ධිය ඉහළ යාම.8.දේශීය සේවා නියුක්තිය ඉහළ දමා ගත හැකි වීම.

9.අඩු මිළට ආනයනය කිරීමෙන් දේශීය උද්ධමනය පාලනය කර ගත හැකිවීම.

10.බැංකු,රක්ෂණය සහ ප්‍රවාහන සේවා දියුණුවීම.

11.රටවල් අතර ආර්ථික සහයෝගීතාව වර්ධනය වීම.

<u>අභ්‍යාස</u>

1.නිරපේක්ෂ වාසි න්‍යාය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.